

# වසන්තය ඇවිත්

**මරිනි වෙත්තසිංහ**
මිල්පාක්

ආච්චිගේ සිල් රෙද්දද ඇඳන්
පොඩි නෙක්ටාරින් ගහ හැඩවීලා
දළු රිකිලි දමා අතු පතර විදා
හොඳ මංගල්ලෙ මෙයැයි පවසාලා

පිනි බින්දු වැටී ලා පියලි මතින්
සුදු සේලේ තවත් හැඩ වීලා
තුරු මුදුනේ සිටින් නෙක පාට ගිරව්
හොඳ මංගල්ලෙ මෙයැයි පවසාලා

දළු රිකිලි නවා උණු හාදු දෙමින්
රස රහස් කියා මද සුළඟ නටයි
හොඳ මංගල්ලෙ මෙයැයි පවසාලා
හොඳ මංගල්ලෙ මෙයැයි පවසාලා





කමලනී දසනායක

## පහන් එළි



My World
By Shanika Somatilake




# "විවිධත්වය"

**දයා මානෙල් සෙනෙවිරත්න**

ඉර හඳ පායන්නේ කාටත් එක	ලෙසටයි
මිනිසා හටගන්නේ මවකගෙ කුස	තුලමයි
අවටින් හමන මඳ නල හැමටම	පොදුවෙයි
එනමුදු මිනිසා විවිධත්වෙන් ඇයි	පුදුමයි

දුබලයා පාගගෙන ප්‍රබලය නැගී	සිට
මුදලේ බලෙන් පාදට වැඩ කර	යසට
දුබලය විසි වී යයි අසරණ	කමට
බලු වැඩ කලත් දුබලය වැජඹෙයි	යසට

පින් පව් අනුව ජීවය සරි කර ගන්න
දහමෙන් සාමයෙන් ජීවත් වී	ඉන්න
දුබලය සිතන්නේ එහෙමයි	සැනසෙන්න
දුබලය බලන්නේ මුදලින්	වැජඹෙන්න

එකලේ මිනිසා පව් පින් ගැන දිවි	ගෙව්වා
මෙකලේ මිනිසා කාසිය සොයමින්	දිව්වා
පව් පින් කොහෙද මේ සේරම බොරු	එව්වා
කියමින් සිනහසී මුදලේ බල	සෙව්වා